# විද්‍යාලංකාර පිරුවනින් ආලෝකය ලැබූ භාරතීය පඬිවරු

උපුල් රංජිත් හේවාවිතානගමගේ

ව්‍යවහාර වර්ෂ 1875 නොවැම්බර් මස 01වැනි දින රත්මලානේ ශ්‍රී ධර්මාලෝක නායක ස්වාමීන් වහන්සේ විසින් පිහිටුවා වදාළ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන මේ වන විට වසර 132ක ඉතිහාසයකට හිමිකම් කියන්නේ ය. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ පුරෝගාමිත්වයෙන් ඇරඹුණු සම්භාව්‍ය අධ්‍යාපනය පුනරුත්ථාපනය කිරීමේ අති උදාර කර්තව්‍යය තවතවත් ඉදිරියට ගෙන යමින්, නගාහුරු කිරීමත් අරමුණු කොට ගෙන බිහි වූ විද්‍යාලංකාර පිරිවෙන ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියන විහාරස්ථානයක් වශයෙන් වර්තමාන ශාස්ත්‍රීය ලෝකයේ ද අතිමහත් ගෞරවයට පාත්‍ර වී ඇත්තේ ය. වසර 132ක් යනු සුළු කොට තැකිය හැකි කාලයක් නොවන්නේ ය. මෙවැනි දීර්ඝ කාලයක් තිස්සේ ශාස්ත්‍රීය සේවය ම අරමුණු කොට ගෙන ආයතනයක් පවත්වා ගෙන ඒම ම අතිශය දුර්ලභ සිදුවීමක් ලෙස හැඳින්වීම අතිශයෝක්තියක් වන්නේ නැත. එමෙන් ම, හුදු ශාස්ත්‍රීය ලෝකයේ පමණක් නොව ආගමික, සාමාජීක, සංස්කෘතික සහ දේශපාලනික ක්ෂේත්‍රයන්හි විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන්, වෙසෙසින් ම ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් වූ විද්‍යාලංකාර පිරිවෙනේ භූමිකාව හා දායකත්වය ලක් ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන්නකි.

ධර්ම-ශාස්ත්‍රීය සේවය මූලික වූ විද්‍යාලංකාරය නමැති විද්‍යා ප්‍රදීපයේ ආලෝකය ලක්දිව පමණක් නොව අන්‍ය දේශ-දේශාන්තරවලට ද පැතිරී යෑම තවත් විශේෂ කරුණක් සේ සැලකිය යුතු වන්නේ ය. විද්‍යාලංකාර ඉතිහාසයට අනුව මේ සියලු අභිප්‍රායයන් සාක්ෂාත් කර ගැනීමේලා අතිශය උදාර කැපවීමකින් කටයුතු කළ පරිවේණාධිපතීන් වහන්සේලා සඳහන් වෙති. එනම්,

---

© උපුල් රංජිත් හේවාවිතානගමගේ
සංස්. පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමි, ආර්. එම්. ඩබ්. රාජපක්ෂ, ඉන්ද්‍රා දසනායක, ගොඩමිල්ලා උපුල්
මානව ශාස්ත්‍ර පීඨ සංග්‍රහය, 5 කලාපය, 2008, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.